# මෙල්බන් සිංහල කලාවේ ස්වර්ණමය යුගය

මහින්ද දිසානායක දිවුල්ගනේ

සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස විද්වතුන් සලකන්නේ ගi, පiයෙන් පරිපෝෂිත වූ කෝට්ටේ යුගයයි. සංදේශ කාව්‍ය, විවිධ ගi රචනා හා පi කාව්‍යයන් විශාල ප්‍රමාණයක් සාහිත්‍යකරණයෙහි යෙදුන පඬිවරුන් අතින් රචනා වූ අතර අනෙකුත් කාලයන් හා සසඳන විට ප්‍රමාණාත්මක හා ගුණාත්මක අගයෙන්ද කෝට්ටේ යුගය වැදගත් වේ.

මෙල්බන් නගරයේද සිංහල ජනසමූහය තුළ පෙර නුදුටු විරූ උනන්දුවක් හා සාහිත්‍ය නිර්මාණකරණයෙහි යෙදීමත් නිසාම මෙල්බන් නූතන යුගය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකීම අතිශයෝක්තියට බර වූ කියමනක් නොවේ.

සංගීත සංදර්ශණ, චිත්‍රපටි, නාට්‍ය, සී.ඩී. පටි නව නිර්මාණ, නැටුම් සංදර්ශන, කලා සංදර්ශන ආදී නානා විධ වූ කලා නිර්මාණයන් දැක ගැනීමේ විඳ ගැනීමේ භාග්‍ය මෙල්බන් නගරවාසී ශ්‍රී ලාංකික සහෘද ජනතාවට නොඅඩුව ලැබී තිබීමත් එහි වර්ධනයත් දැකිය හැකිවේ. ඒ නිර්මාණයන් අතරින් මෙහිම නිර්මාණය වූ ඒවා මෙන්ම ශ්‍රී ලංකාවේ කලාකරුවන්ගේ දායකත්වය නොඅඩුව ලැබීම විශේෂත්වයකි.

සංගීත සංදර්ශන සුවිශේෂිත වූ තැනක් ගන්නා අතර පණ්ඩිත් අමරදේවයන්, විශාරද නන්දාමාලිනියගේ පටන් සම්භාව්‍ය හා සම්භාව්‍ය නොවන ගායන ශිල්පීන් සංගීත වේදීන් මෙහි සපැමිණි වාර බොහෝය.

මේ අතරින් පසුගිය ජූලි මස 22 වෙනි දින CROSSWAY CENTRE ප්‍රසංග වේදිකාවේදී දිග හැරුණු ''තරු විසිතුරු ගී දැහැන'' කාගේත් සිත් අමන්දානන්දයට පත් කළ නිර්මාණයක්ම විය. ''සුරවි'' කාන්තා මාසික සඟරාව සංවිධානය කොට ඉදිරිපත් කළ මෙම ප්‍රසංගය සඳහා උසස් වූ රස වින්දනාත්මක පිරිසකගේ සහභාගීත්වය අගය කළ හැකි කරුණකි. ප්‍රවීණ ගායන ශිල්පී නාරද දිසාසේකරයන්ගේ පළමු මෙල්බර්න් සංගීත සංචාරයම ගීත රසික රසිකාවියන්ගේ මහත් වූ ප්‍රසාදයට හේතුවිය.

''පිපී පිපී රේණු නටන'', ''ආරිච්චි බෝරිච්චි'', ''මුලු හදින් මම'', ''චන්ද්‍ර බිම්බ යුරු'' ආදී ගීත කිසිදා ගීත ලෝලීන් තුළින් අමතක වී ගිය පැරණි ගීත ලෙස නොපෙණුනි. ඔවුන්ගේ මනසෙහි පතුලෙහිම රැඳී තිබී අවදි වී යළි යළි මතකයට නැගී ප්‍රබෝධමත් වූ සෙයක් පෙණුණි. දිසාසේකරයන් දශක හතරකට වැඩි කාලයක් ගායකයෙකු, සංගීතඥයෙකු ලෙස සංගීත ක්ෂේත්‍රයේ බොහෝ අත්දැකීම් ලැබූවෙක් විය.

ස්වකීය නිර්මාණ තුළින් වඩා පර්යේෂණාත්මක යමක් බිහි කර ලන්නට උත්සාහ කළ සංගීතඥයන් අතරින් මහාචාර්ය අමරා රණතුංග හා ආචාර්ය දයාරත්න රණතුංගයන්ට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. සුභාවික වූ සංගීතය කුමක්දැයි දැන හැඳිනගත් ඔවුන් නව අනුභූතීන් සොයා සමාජ යථාර්ථ නිරූපණය කරමින් අනුකරණයෙන්ද ඈත් වෙමින් නව සංගීත ගීත සංස්කෘතියක්ද බිහි කිරීමේ පුරෝගාමීන් දෙපළක් ලෙසද සහෘද ගෞරවය පිරි නැමේ. ''උදුම්බරා'', ''ජයසිරි මහා බෝධී'', ''මහ රෑ යාමේ'', ''සපුමල් සුවඳක්'', ''උපුලි'', ''දුරස් වන්නට'' ආදී ගීත ශ්‍රී ලාංකික රසිකයන් දයාර්ද්‍ර හවකින් වැළඳගත් අතර මෙල්බර්න් සහෘද රසිකයන් අයා ගත් දෙසවනින් නොසෙල් වී ශ්‍රවණය කළහ. සංගීත ඥාණය, සාහිත්‍ය දැනුම වාදනය ආදී බොහෙ- ා් අත්දැකීම් ප්‍රගුණ කිරීම ඔවුන්ගේ සංගීත දිවිය ආලෝකමත් කරලීමට සමත්විය. එදා සන්ධ්‍යාවේදී ප්‍රසංග ශාලාවෙන් සමුගෙන ගියත් ඔවුන්ගේ ගීතයක් මුමුණමින් යාමම යහපත් ගීතය වනාහි සර්ව කාලීන, සර්වත්‍රික, අර්ථ පූර්ණ, රස පූර්ණ භාවයෙන් යුතු එකක් යයි කීමට හැකිවේ.

සංගීත සංදර්ශන, චිත්‍රපටි, නාට්‍ය, සීඩී පට, නව නිර්මාණ, නැටුම් සංදර්ශන, කලා දර්ශණ මෙම සංගීත සන්ධ්‍යාව සංවිධානය කළ සුරවි සඟරාවේ විනීතා තලේරත්න හා සුනිල් දෙපල ප්‍රසංගය සඳහා පැමිණ සිටි ශ්‍රාවක පිරිසටද පුංචි තිළිණයක් පරිත්‍යාග කිරීම විශේෂයෙන් මෙහිදී වැදගත් කරුණකු ලෙස කැපී පෙනුණි. මෙල්බන් පාඨකයන්ට අඩුවක් සපුරා ලමින් කාන්තා සඟරාවක් නිර්මාණය කිරීම මෙල්බන් සිංහල සාහිත්‍ය වංශ කථාවේ කඩයිමක් හා මතක සටහනක් වැන්න.

එදින කාගේත් ප්‍රසාදයට පාත්‍ර වූ තරංගා වාදක මණ්ඩලයට තරුණ දරුවන් ඇතුළත්වීම හා ඔවුන්ගේ වාදන හැකියාව ප්‍රසංගය ආලෝකමත්වීමට සුභ නිමිත්තක්ම විය. තරංගා වාදක මණ්ඩලය ශ්‍රී ලංකාවේ සිට මෙහි පැමිණෙන පණ්ඩිත් අමරදේවයන්ගේ පටන් සම්භාව්‍ය හා සියලුම ගායන ශිල්පීන්ට විශාල සහයක් වෙමින් ඔවුන්ට සංගීතයෙන් දායකවීමත් මෙහි මෙල්බන් නගරයේ බිහිවන ගායන ශිල්පීන්ට, අත්වැලක් වී උසස් වූ රසවින්දනයක් සඳහා යහපත් ගීත කලාවක් පවත්වා ගැනීමේ උසස් වගකීම මැනවින් හඳුනා ගත් වාදක මණ්ඩලයක්වීම මෙල්බන්වාසී ශ්‍රී ලාංකික අපිට ආශිර්වාදයකි. එදින ප්‍රධාන ගායන ශිල්පීන්ට සහය දුන් අත්වැල් ගායනා හා සහය ගායනාද මෙහිදී වැදගත් කාර්ය භාරයක් ප්‍රසංගයේදී ඉදිරිපත් කරයි.

විශේෂයෙන් මෙම සංගීත ප්‍රසංගය ගැන විවරණයක් කරන්නට සිත පෙළඹ වූවද තවත් මෙවන් හරවත් ප්‍රසංග ඉදිරිපත් නොවූවා නොවේ. එහෙත් මෙහිදී දුටු විශේෂත්වය මෙවැන්නක් පෙළගස්වන්නට හේතු කාරණා වන්නට ඇත. මාසික ප්‍රජා පුවත්පත් ගුවන් විදුලි ආදී ජනසන්නිවේදන මාධ්‍යයන් විශේෂ මෙහෙවරක් ශ්‍රී ලාංකීය ප්‍රජාවට මෙවන් සාහිත්‍ය කලාවටද ඉටු කිරීම මෙහිදී වැදගත් වේ.

විශේෂයෙන් මෙම පුවත්පත් ගුවන් විදුලිය හැරුණු කොට අන්තර්ජාල මඟින්ද සෑම නිර්මාණයක් සඳහාම විශාල ආලෝකයක් ලැබීම නොවැලැක්විය හැක්කකි. විශේෂයෙන් දක්ෂතා පිරිපුන් නිර්මාණකරුවන් රැසක් මෙල්බන් නගරය පුරා විසිරී සිටීමත් සිංහල සාහිත්‍ය නැංවීමෙහිලා ඔවුන්ගේ පුරෝගාමීත්වයත් ඉමහත් පිටුවහලක් සලසයි. මෙල්බන් යුගය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස එළඹී ඇති මේ කාලපරාසය පෙන්නුම් කිරීම වරදක් නොවේ. සාහිත්‍ය අංග සියල්ලම උසස් වූ සාහිත්‍ය රස වින්දනයක් සඳහාම නිර්මාණාත්මක වූ පරිනත චින්තනයකින්, භාවාතිශය ගුණයෙන්ම යුතුවීම අනාගතයේ සුභ නිමිත්තකි. ■




ශ්‍රීපාලි එදිරිසිංහ
**සුදුතාරකා**

සෙව්වන්දිකා අබේරත්න
**නෙතඟ නිලුපුල්**

මිහිඳු මාපා
**කිඳුරු කොදෙව්වේ**

ලලිත් අරුණශාන්ත
**තනිතරුව/ ඉස්පිලි පාපිලි/ විසිරිලා සිත**

මේ ගී තැටි දැන් සූරිය වෙතින් තැපෑලෙන් ලබාගන්න මිල ඩොලර් 10. තැපැල් ගාස්තු අපෙන්

Sooriya marketing Services
22 Lorne Street
Lalor Vic 3075
Tel 03 9402 5380


## කෑමට පසු

අක්ෂදතොරොස් ලියයි

